ලංකාදීප

# එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයට ශ්‍රී ලංකාවෙන් සහභාගි වූ දූත පිරිසේ නායකත්වය දැරූ ජිනීවා හි එ.ජාතීන්ගේ කාර්යාලයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත රවිනාථ ආරියසිංහ මහතා ශ්‍රී ලංකාව පිළිබඳ යෝජනාව සම්බන්ධ සැසිවාරයේ දී ඉදිරිපත් කළ සම්පූර්ණ කතාව.

ශ්‍රී ලංකාවේ යථා තත්ත්වය පිළිබඳව නොදැන අද මානව හිමිකම් කවුන්සිලයට පැමිණි ඕනෑම අයකුට, ශ්‍රී ලංකාව මේ මිහිපිට ඇති මහත් ගැටලුකාරී රට යැයි සිතීම ගැන වැරැද්දක් පැවිය නොහැක. ඒ කෙසේ වුවද ඔබ දන්නා පරිදි ශ්‍රී ලංකාවට පැහැදිලිවම කවුන්සිලයේ අඛණ්ඩ අවධානයට බිලය ලබාදීමේ හදිසි අවශ්‍යතාවක් නැත.

ශ්‍රී ලංකාවට එරෙහිව ඇමෙරිකාව විසින් පසුගිය වසර තුන ඇතුළත දී තෙවැනි වරටත් ඉදිරිපත් කරන ලද යෝජනාව HRC/25/LI/Rev.1 දරන මෙම කෙටුම්පතයි. මෙය ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ ඊට අදාළ රට වන ශ්‍රී ලංකාවේ කැමැත්තකින් තොරව ය. මෙය ඉදිරිපත් කළේ කලාපීය රටවල් ද පිළිගන්නා පරිදි ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයත් කවුන්සිලයත් සමඟ අඛණ්ඩ සබඳතාවක් පවත්වා ගනිමින් සිටියදී ය. වගවීම ද ඇතුළුව ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට අදාළ කාරණාවලදී අඛණ්ඩ සහ නිශ්චිත වර්ධනයක් ශ්‍රී ලංකාව විසින් තම දේශීය ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක රාමුව තුළ පෙන්නුම් කරමින් සිටියදීය.

කෙසේ වුවද අර්බුදය සහ ත්‍රස්තවාදය අවසන් වීමෙන් වසර පහක් ගෙවී තිබියදී, කවුන්සිලය තුළත් ඊට සමාන්තර සැසි තුළදීත් ශ්‍රී ලංකාව කෙරෙහි පෙර නොවූ විරූ අවධානයක් යොමු කෙරී තිබේ. ශ්‍රී ලංකාවට එරෙහිව සිදුකෙරෙන පැහැදිලි දේශපාලනික ක්‍රියාවක් හැටියට කිව හැකි මේ පසුපස ඇති සැබෑ අභිප්‍රායයන් සහ විධානාත්මක ක්‍රියා පිළිබඳව බොහෝම රටවල් විසින් ප්‍රශ්න කර ඇති අතර දිගටම ප්‍රශ්න කරමින් ද සිටී.

විසින් ප්‍රශ්න කර ඇති අතර දිගටම ප්‍රශ්න කරමින් ද සිටී.

අන්තර්ජාතික නීතියේ පිළිගත් මූලධර්මය වන්නේ තේරුම් ගෙන ඇති දුක්ගැනවිලි සමනය කර ගැනීමට අපේක්ෂා කරන පාර්ශ්ව, අන්තර්ජාතික රංගභූමියේ සහාය ලබා ගැනීමට පෙර දේශීය බලාධිකාරය තුළ හැකි සියලුම ක්‍රියාමාර්ග ගත යුතු බවය. මේ නිසා උල්ලංඝනය සිදුවී ඇතැයි පැවැසෙන රාජ්‍ය වෙත තමන්ට හැකි පරිදි ඒවා නිවැරැදිකර ගැනීමට අවස්ථාව තිබිය යුතුය. අන්තර්ජාතික යාන්ත්‍රණයක් කරා යොමුවන්නට පෙර තම දේශීය ක්‍රමවේද සියල්ල ඒ සඳහා යොදවාගත යුතුය. මහත් වූ දේශීය යාන්ත්‍රණයක් තිබියදී කවුන්සිලය ඉදිරියට මෙවැනි යෝජනාවක් ගෙන ඒම හාස්‍යජනකය. රාජ්‍යයක ස්වෛරීභාවය බලහත්කාරයට ලක්කිරීමක් හැටියටත් දේශීය ක්‍රියාවලියේ ප්‍රතිඵලය සම්බන්ධයෙන් පෙර පූර්ව විනිශ්චයක් හැටියටත් මෙය සැලකිය හැකිය.

"ඒ අනුව මේ කවුන්සිලය ඉදිරිපිට ඇති යෝජනා කෙටුම්පත අන්තර්ජාතික නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීම හැටියට ස්ථාපනය වනවා පමණක් නොව ස්වෛරී රාජ්‍ය පිළිබඳ පිළිගත් ගෝලීය ක්‍රමවේදය තුළ අන්තර්ජාතික සබඳතා පවත්වා ගැනීමේ භයානක පූර්වාදර්ශයක් සපයන්නේය. මෙයින් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියෙන් සහතික කර ඇති සාමාජික රටවල නිදහසටත්, ස්වෛරීභාවයටත් බැරෑරුම් තර්ජනයක් ද එල්ල විය හැකිය.

ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේදී රජය මගින් අඛණ්ඩ ප්‍රගතියක් පෙන්වා තිබියදීත් එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට කැප වී සිටියදීත්, මෙම කෙටුම්පතේ යෝජනාවල ඇති අවසානාත්මක බව සහ බලහත්කාරය විසින් ශ්‍රී ලාංකික ජනතාවගේ ඕනෑ එපාකම්වලට එරෙහිව දිගටම කටයුතු කිරීම මගේ රජයේ බරපතළ සැලකිල්ලට ලක් වූ කරුණක් බවට පත්ව තිබේ. පෙර නොවූ පරිදි මේ කවුන්සිලය තුළ දී ශ්‍රී ලංකාවට සාපේක්ෂ නොවන සහ අනවශ්‍ය අවධානයක් ලබාදීම, රාජ්‍ය අතර සබඳතා පවත්වා ගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය ලබාදෙන මූලික නීති උල්ලංඝනය කිරීමකි.

## දේශපාලනීකරණය වූ යෝජනා අන්තර්ගතය ආක්‍රමණකාරීයි

# දේශපාලනීකරණය වූ යෝජනා අන්තර්ගතය ආක්‍රමණකාරීයි

[illegible] ශ්‍රී ලාංකික ජනතාවගේ ඕනෑ එපාකම්වලට එරෙහිව දිගටම කටයුතු කිරීම මගේ රජයේ බරපතළ සැලකිල්ලට ලක් වූ කරුණක් බවට පත්ව තිබේ. පෙර නොවූ පරිදි මෙම කවුන්සිලය තුළ දී ශ්‍රී ලංකාවට සාපේක්ෂ නොවන සහ අනවශ්‍ය අවධානයක් ලබාදීම, රාජ්‍ය අතර සබඳතා පවත්වා ගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය ලබාදෙන මූලික නීති උල්ලංඝනය කිරීමකි.

මෙම යෝජනා කෙටුම්පතේ අංගලක්ෂණ මින් පෙර ඉදිරිපත් කරන ලද 19/2 සහ 22/1 දරන යෝජනාවලින් බැහැරව යමින් පදනම් විරහිත සහ නිවැරදි බව සනාථ නොකළ සාමාන්‍ය මට්ටමේ චෝදනා හැටියට පැවැති අලුත් කරුණු ද ඇතුළත් කර තිබේ. සිරස්තලය වෙනස් කර තිබීමෙන් ම එය ප්‍රතික්ෂේප වෙයි. "මානව හිමිකම්" යන්න එයට දැන් එකතුවී තිබේ. අතීතයෙන් වර්තමානයටත් අනාගතයටත් මෙම යෝජනාවේ විෂය පථය පුළුල් කිරීමේ අදහසක් එතුළ ඇත. තාර්කික හේතුවක් නැතුවම එසේ සිදුකර ඇත්තේ යටි අදහස් ඇතිව ක්‍රියාකරන කීපදෙනෙකුගේ අපේක්ෂා ඉටුකිරීම වෙනුවෙනි. අත්තනෝමතිකව මෙසේ විෂය පථය වෙනස් කිරීම පිළිගත නොහැකිය.

අන්තර්ගතය සැලකීමේදී යෝජනා කෙටුම්පත මහත් සේ ආක්‍රමණික බවක් සහ දේශපාලනීකරණය වීමක් පෙන්වයි. ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ විවිධ අංශවලදී ශ්‍රී ලංකාව පෙන්වා ඇති සැලකිය යුතු වර්ධනය සඳහා ලැබිය යුතු පිළිගැනීම හා සැලකිලි ලබාදී නැත. දැනට ක්‍රියාත්මක දේශීය යාන්ත්‍රණයට ද එසේම ය. ඇතැම් සිදුවීම් විකෘති කර ඇත. වැලිවේරිය සිදුවීම ඉදිරිපත් කර ඇත්තේ නිරායුධ උද්ඝෝෂණකරුවන්ට එල්ල කරන ලද ප්‍රහාරයක් හැටියට ය. එසේ වුවද මහ කොමසාරිස්වරියගේ වාර්තාවේම එය වෙනස් ආකාරයකින් ඉදිරිපත් කර තිබේ. එම උද්ඝෝෂණය "ප්‍රචණ්ඩකාරී වූ බව" එහි පිළිගෙන තිබේ.

උතුරු පළාත් සභා ඡන්දයේ දී ප්‍රචණ්ඩකාරී සිදුවීම් සහ

**ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේදී රජය මගින් අඛණ්ඩ ප්‍රගතියක් පෙන්වා තිබියදීත් එක්සත් ජාතීන්ගේ සංවිධානය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට කැප වී සිටියදීත්, මෙම කෙටුම්පතේ යෝජනාවල ඇති අවසානාත්මක බව සහ බලහත්කාරය විසින් ශ්‍රී ලාංකික ජනතාවගේ ඕනෑ එපාකම්වලට එරෙහිව දිගටම කටයුතු කිරීම මගේ රජයේ බරපතළ සැලකිල්ලට ලක් වූ කරුණක් බවට පත්ව තිබේ.**



එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත

## රවිනාථ් ආරියසිංහ

සියගැන්වීම සම්බන්ධයෙන් සාවද්‍ය ලෙස කර ඇති සඳහන පදනම් විරහිත බව මෙම ඡන්දය නිරීක්ෂණයට සහභාගී වූ අන්තර්ජාතික මැතිවරණ නිරීක්ෂකයන් විසින් ලබාදී ඇති ප්‍රගති වාර්තා අනුව කිව හැකිය. මෙම ඡන්දයේ ප්‍රතිඵලය හැටියට දමිළ ජාතික සංධානය (TNA) සියයට 80ක ඡන්ද ප්‍රතිශතයක් ලබා බලයට පත්වීම එම ඡන්දය පැවැත්වීමේ ප්‍රජාතාන්ත්‍රික බවට දිවුරුම් සහතිකයක් සපයයි.

"එසේම ලිංගික සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය" සම්බන්ධයෙන් චෝදනා ද සිවිල් සමාජයට එල්ල වූ තර්ජනය කිරීම් සහ පලිගැනීම් පිළිබඳ වාර්තා කිරීම් ද, සුළු ආගමිකයන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය ද පිළිබඳව කෙටුම්පතේ සඳහන් චෝදනා සාක්ෂි හෝ සංඛ්‍යා ලේඛන දත්ත මගින් නිවැරැදි බවට තහවුරු කර නැත. මෙම චෝදනා ප්‍රතික්ෂේප කරමින් නිශ්චිත කරුණු සහිත පොරතුරු රජය මගින් මහ කොමසාරිස්වරියගේ වාර්තාවට ලබාදුන් විස්තර සටහනේ දක්වා ඇත. මෙම චෝදනා සනාථ කිරීමට කිසිදු නිශ්චිත තොරතුරක් ඇයගේ වාර්තාවේ නැති බව ද එයින් අවධානය කර තිබිණි. ශ්‍රී ලංකාව තුළ ලිංගික හිංසනවලට කිසිදු සමාවක් නැත. නීතිය ක්‍රියාත්මක කරන

බලධාරීන්ට ඉදිරිපත් වන සියලු පැමිණිලිවලට ගත හැකි සියලු පියවර ගෙන ඇති අතර එය ඉදිරියට ද එසේම ය. එසේම ශ්‍රී ලංකාව තුළ දියුණු සිවිල් සමාජයක් ද ක්‍රියාත්මක අතර ජිනීවා හිදී මෙවරද ඇතුළුව දිගින් දිගටම සැසිවාරවලට ඔවුන් සහභාගි වීම තුළින් ද එය පැහැදිලි වනු ඇත. යෝජනා කෙටුම්පත සම්බන්ධ නොනිල සාකච්ඡා වලදී ඔවුන් ලබාදුන් සක්‍රිය දායකත්වය ද මේ කවුන්සිලය දැකගත්තේය. ඒ ආකාරයටම අපගේ සියලු සතර ආගමික ස්ථාන සම්බන්ධයෙන් වාර්තා වූ සියලු සිදුවීම පිළිබඳව රජය මඟින් වහාම පියවර ගනු ලැබූ අතර ඒ සම්බන්ධව විමර්ශනය කොට අධිකරණ ක්‍රියාමාර්ග ද ගනු ලැබ තිබේ. රජය මේ සිදුවීම් හෝ පහරදීම් හෝ කිසිසේත් අනුමත නොකරන බව සාක්ෂි මඟින් පෙන්වා දී තිබේ.

මෙම යෝජනාව ගෙන එන යෝජකයන් විසින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන (එල්.එල්.ආර්.සී.) කමිටුව මඟින් නිකුත් කරන ලද වාර්තාවේ අඩංගු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා එකී කමිටුව මඟින් පිහිටුවන ලද ජාතික සැලසුම් මෙහෙයුම් (එන්.පී.ඒ.ඒ.) නොපිළිගැනීමට කටයුතු කර ඇත. අදාළ සහ අනවශ්‍ය කරුණු ආමන්ත්‍රණයෙහි ලා එම කමිටුව නම්‍යශීලීව කටයුතු කරන අතරම එහි විෂයපථය ද ප්‍රමාණවත් තරම් පුළුල් ය. මේ නිසා එල්.එල්.ආර්.සී. - එන්.පී.ඒ.ඒ. විෂය පථය තවදුරටත් පුළුල් කරන්නැයි කරන ඉල්ලීම එන්.පී.ඒ.ඒ. හි ආකෘතිය ප්‍රමාණවත් ලෙස අධ්‍යයනය

# තුන්වැනි පාර්ශ්වයකට දොර විවර කිරීමක් ද?

නොකිරීම හේතුවෙන් ඉදිරිපත් වුවකි.

උතුරු පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් යෝජනා කෙටුම්පත විසින් විශේෂයෙන් කර ඇති සඳහන ද පක්ෂපාතී වුවකි. 13 වැනි සංශෝධනය ව්‍යවස්ථාපිතව ස්ථාපනය කෙරෙන සියලුම පළාත් සභා කෙරෙහි එක හා සමානව ක්‍රියාත්මක වන්නකි. සෑම ශ්‍රී ලාංකිකයකුටම ජාතිකත්වය ඇදහීම හෝ ආගම කුමක් වුවද සම අයිතිවාසිකම් භුක්ති විඳීමට ඇති අයිතිය යළි තහවුරු කරන බවට කෙටුම්පත් ප්‍රවේශයේ ඡේදයක ඇති සඳහන යෝජනාවේ ආරම්භක ඡේදයට නොගැළපෙන බවක් දක්වන්නේ කෙටුම්පතට ආවේණික පරස්පර බව මතු කරමිනි.

අද ශ්‍රී ලංකාව තුළ දමිළ ජනතාවගේ ඡන්දයෙන් පත් වූ නියෝජිතයන්ට කේන්ද්‍රස්ථානයේ පමණක් නොව පළාත් මට්ටමින් ද සිය හඬ නැංවීමට හැකිය. උතුරු පළාත් සභාවේ ආණ්ඩු පක්ෂය ටී.එන්.ඒ. ය. උතුරේ මැතිවරණයක් පැවැත්වීමත් එහි බලය ද්‍රවිඩ සන්ධානයට හිමිවීමත් ශ්‍රී ලංකාව තුළ මහත් දිදුළන සක්‍රීය ප්‍රජාතන්ත්‍රවාදයක් පවතින බව ඔප්පු කර පෙන්වයි. ද්‍රවිඩ සන්ධානයට මෙන්ම ශ්‍රී ලංකාවේ සෙසු කොටස්වලට ද සිංහල වේවා, දමිළ වේවා, මුස්ලිම් වේවා නැතහොත් වෙනත් ඕනෑම ජන වර්ගයක් වේවා ඔවුන්ට ද හඬක් ඇත. එය මේ කවුන්සිලය තුළ දී නොඇසෙන හඬක් විය හැකිය. එසේ විවිධ අදහස් දැක්වීම හොඳින් ක්‍රියාත්මක ප්‍රජාතන්ත්‍රවාදයේ සහ සත්‍ය ලෙසම බහුවාර්ගික සමාජයක ස්වභාවයයි.

යෝජනා කෙටුම්පත මගින් සත්‍ය සෙවීමේ විකල්ප, සමගාමී ක්‍රමවේදයක් සහ යාන්ත්‍රණයක් බලහත්කාරයෙන් හඳුන්වා දීමට කරන උත්සාහය ප්‍රතිවිපාක සහිත අපැහැදිලි සහ නිරර්ථක වුවකි. ඉතා වැදගත් වන්නේ වගවීම සම්බන්ධ කරුණු ආමන්ත්‍රණයට විධිමත් දේශීය ක්‍රමවේදයක් නොමැති බවට කෙරෙන චෝදනාවට සාක්ෂි මත පදනම් වූවක් නොවීමය. මාගේ නියෝජිත පිරිස විසින් මේ කවුන්සිලය ඉදිරියේ එල්.එල්.ආර්.සී. ද ඇතුළුව ප්‍රතිසන්ධාන කටයුතු සම්බන්ධ රාමුව තුළ ක්‍රියාත්මකව පවතින ක්‍රමවේදය පිළිබඳව කළ විස්තරය අනුව එය පැහැදිලි වනු ඇත. මාගේ විදේශ කටයුතු අමාත්‍යවරයා විසින් මේ සැසිවාරයේ ඉහළ දූතයන් හට ඉදිරිපත් කළ ප්‍රකාශයේ ප්‍රතිසන්ධාන කටයුතු පිළිබඳව එම ක්‍රමවේදය සහ යාන්ත්‍රණය සම්බන්ධ විශේෂිත සඳහන් කිරීම සමග විස්තරාත්මක හෙළිකිරීමක් සිදු කරන ලදී.

එසේම මේ යෝජනා කෙටුම්පත ඉදිරිපත් කිරීමේ ක්‍රියා පිළිවෙළේ පවතින විෂමතා සහ අක්‍රමවත් බව අප විස්මයට පත් කරවයි. මේ ලියැවිල්ල නිල නොවන මට්ටමින් සාකච්ඡාවට ලක් කිරීමේදී කලාප ගණනාවක රටවල් මගින් ඒවාට එරෙහිව හඬ නගනු ලැබීය. එහි සංවේද්‍ය කරුණු අඩංගු බව ද සඳහන් විය.

මේ කෙටුම්පත මගින් ඇතැම් රටවලට කවුන්සිලයේ පිළිගත් සම්ප්‍රදායයන් මගහැර කටයුතු කිරීමට භයානක පූර්වාදර්ශයක් සපයයි. එමගින් කවුන්සිලයේ නීත්‍යානුකූල භාවය සහ සහතිකය ප්‍රශ්න කරවන්නේය.

යෝජනා කෙටුම්පතේ මුලින් සඳහන් ඡේදයෙන්ම ප්‍රධානම මානව හිමිකම් කවුන්සිල යෝජනා 60/251 සහ අයි.බී. යෝජනාවලිය උල්ලංඝනය කරමින් මානව හිමිකම් මහකොමසාරිස් කාර්යාලය වෙත විමර්ශනාත්මක වරමක අයිතිය හිමිකර දී තිබේ. එවැනි විමර්ශනයක් සිදු කිරීමට මානව හිමිකම් මහකොමසාරිස් කාර්යාලයට වරමක් නැතුවා පමණක් නොව ඒ සඳහා හැකියාවක් හෝ සම්පත් ද නැත. එසේම ප්‍රධාන ඡේදයේ අදාළ විශේෂඥයන් යන සඳහන ද අපැහැදිලිය. එය මානව හිමිකම් කොමසාරිස් කාර්යාලය මගින් සිදුකරනු ලබන විමර්ශනයක මුවාවෙන් තුන්වැනි පාර්ශ්වයකට දොර විවෘත කිරීමේ ප්‍රයෝගයකි. අන්තර්ජාතික විමර්ශන යාන්ත්‍රණය සම්බන්ධ සඳහා පැහැදිලි වුවද එය අපැහැදිලි භාෂාවකින් ගොතා තිබීම විවිධ අර්ථ කථන සැපයීමට මුල පුරයි.

24 වැනි පිටුවට...

පරිවර්තනය
**මොහාන් ලාල් පියදාස**

# ස්වාධීනත්වයට ස්වෛරීත්වයට අභියෝගයක්

4 වැනි පිටුවෙන්...

යෝජනා කෙටුම්පතේ සඳහන් වන අපේක්ෂිත යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ වියහියදම් සම්බන්ධ සඳහන ද උනන්දුව ඇති කරවන්නකි. මේ යාන්ත්‍රණය සඳහා වියදම් දැරිය යුත්තේ නිත්‍ය අය වැය හරහා බව එහි සඳහන්ය. මේ අය වැය සම්බන්ධයෙන් විශේෂිත නියෝගයක් හරහා ක්‍රියාත්මක වීම පූර්ව අවශ්‍යතාවකි. ඊට අතිරේකව මානව හිමිකම් කොමසාරිස් කාර්යාලයෙන් ස්වාධීන පරීක්ෂණයක් කරන්නැයි මුල් ඡේදයෙන් කරන ඉල්ලීම එහිම දෙවැනි ඡේදයෙන් පරස්පරතාවට ලක් කරයි. එහි සඳහන් වන්නේ ස්වාධීන සහ විශ්වාසය රඳවන පරීක්ෂණයක් සිදු කරන්නැයි ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටින බවය. මෙය යළිත් පෙන්නුම් කරන්නේ කෙටුම්පතේ ආවේණික පරස්පර විරෝධී තත්ත්වයයි.

කාල නිර්ණයක් කිරීමට 10 (6) ඡේදයේදී වුවමනාවෙන්ම අසමත්ව තිබීම තුළින් මේ කෙටුම්පත් යෝජනාව 2002 සහ 2009 වසර කාලයට සීමා වීමට හැකිය. මෙය එල්.එල්.ආර්.සී. වාර්තාව මගින් ආවරණය වන කාල සීමාවය. එහෙයින් එල්.ටී.ටී.ඊ. සංවිධානය මගින් 2002 ට පෙර සිදු කරන ලද සියලුම ආකාරයේ අන්තර්ජාතික මානව හිමිකම් නීති උල්ලංඝනය කිරීම සහ අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝනය කිරීමේ මුළුමනින්ම අත්හැරෙනු ඇත.

බලහත්කාරයෙන් පටවනු ලබන යෝජනාවකට ඇති උපහාසය වන්නේ ශ්‍රී ලංකාවේ අනෙකුත් ජනතාවගේ මනෝභාවයන්ද සාමය සහ සංහිඳියාව සම්බන්ධ නීත්‍යනුකූල අභිලාෂයන්ද මුළුමනින්ම නොතකා හැර තිබීමය. මේ යෝජනා කෙටුම්පතින් නියම කරනු ලබන විසඳුම් ස්ථාපිත කළ නොහැකි සහ දේශපාලනික වශයෙන් ඒත්තු ගැන්විය නොහැකි ඒවා බව පවත්වන නිශ්චිත හේතුව ද එයයි.

මේ යෝජනාව ශ්‍රී ලාංකික ජනතාවගේ යහපත උදෙසා අවංකව ගෙන එනු ලැබුවක් හැටියට නොව එල්.ටී.ටී.ඊ.ය සමඟ සබඳතා ඇති අන්තවාදී කොටස්වල නියෝගවලට අනුව කටයුතු කරන ඇතැම් රාජ්‍යවල ඡන්ද දායකයන්ගේ බලකිරීම මත ගෙන එනු ලබන්නක් බව අප විසින් වේදනාවෙන් යුතුව නිරීක්ෂණය කරනු ලබන්නේ මේ සන්දර්භය තුළ සිටිමිනි. එවැනි අන්තවාදී සහ පක්ෂපාතී න්‍යායන් විසින් සැබෑ සත්‍යය පිටු දකින්නේය. එමෙන්ම ශ්‍රී ලාංකික ජනතාවගේ නීත්‍යනුකූල අභිලාෂයන් ද වසර 30 ක් තිස්සේ පැවැති මිලේච්ඡ ත්‍රස්තවාදය පරාජය කරමින් සාමය ස්ථාපිත කර ගැනීම සඳහා සියලු ශ්‍රී ලාංකිකයන් විසින් ගෙවන ලද වන්දිය ද අවමානයට ලක් කිරීමක් වන්නේය.

මේ යෝජනාව සම්බන්ධයෙන් කවුන්සිලය විසින් තීන්දුවක් ගැනීමට පෙර සාමාජික රටවල

එල්.එල්.ආර්.සී. වාර්තාවේ කාලසීමාව හැටියට 2002 පෙබරවාරි 21 වැනිදා සිට 2009 මැයි 19 දක්වා සඳහන් වුවද එහි වාර්තාව සඳහන් කරන්නේ 2002 පෙබරවාරියේදී ක්‍රියාත්මක වූ සටන් විරාම ගිවිසුම අසාර්ථක වීමට බලපෑ හේතු සහ තත්ත්වයන් ද වාර්තාව සැකසීමේ දී සැලකිල්ලට ගත් බවය. එල්.එල්.ආර්.සී. වාර්තාවේ පළමු පරිච්ඡේදයේ 1.22 ඡේදයේ පිළිගෙන තිබෙන්නේ විවිධ ජන කොටස්වල දුක්ගැනවිලි වලට හේතූන් මෙන්ම ලබාදී ඇති කාලසීමාවෙන් එපිටට විහිදෙන බවය. ඒ අනුව එම තත්ත්වය නියෝජනය කරන්නන් හට කොමිසම මගින් සාපේක්ෂ නම්‍යශීලීතාවයක් ලබාදී තිබේ. එහෙත් මේ තත්ත්වය අනුව යෝජනා කෙටුම්පත් 10 (6) ඡේද ය කොතරම් පක්ෂපාතී අන්දමට සකස් කර ඇත්දැයි කිවහොත් එය සකස්කර ඇත්තේ ගැටුම් පැවැති මුළු කාල සීමාව තුළදී සිදුවූ බව කියන දරුණු මිලේච්ඡ ක්‍රියා සියල්ල බැහැර කරමිනි.

මේ කවුන්සිලයේ පිළිගත් ක්‍රමවේදය උල්ලංඝනය කිරීම එමෙන්ම ප්‍රධාන ඡේදවල සඳහන් වන භාෂාවේ අපැහැදිලි බව සියලුම සාමාජික සහ නිරීක්ෂක මට්ටමේ රටවලට භයානක පූර්වාදර්ශයක් සපයයි.

කවුන්සිලය තම කීර්තිය පවත්වා ගන්නට නම් සියලුම සාමාජික රටවලට පැවැරෙන වගකීම වන්නේ මෙවැනි ක්‍රියාවලියක විෂමතා සැලකිල්ලට ගනිමින් මේ ආකාරයේ මිනෑම යෝජනාවක් ප්‍රතික්ෂේප කිරීමය.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් කවුන්සිලය මගින් ගන්නා පියවර හරහා මතුවෙන පරාවිරෝධයෙන් පෙන්නුම් කරන්නේ එය කලින්ම ඇති කරගත් දේශපාලනික සහ පූර්ව විනිශ්චය මත පදනම් වූ න්‍යාය පත්‍රයක් නිර්දය ලෙස සැලසුම් සහගතව ක්‍රියාත්මක වීමක් බවය. ශ්‍රී ලංකාව විසින් ත්‍රස්තවාදය පරාජයට පත්කිරීමෙන් සතියකට පසුව 2009 මැයි මාසයේ 26 වැනිදා ශ්‍රී ලංකාව සම්බන්ධ 11 වැනි සමුළුවේදී එකල මහකොමසාරිස්වරයා විසින් ස්වාධීන වූත් විශ්වාසනීය වූත් අන්තර්ජාතික පරීක්ෂණයක් සඳහා කළ ඉල්ලීම යළි සිහිපත් කිරීම වටී. මේ ඉල්ලීම වරින් වර ගෙන එනු ලැබීය.

මෙවැනි පොදු සම්මුතියකින් තොරව හෘදය සාක්ෂියෙන් ඉල්ලීමක් කරනු කැමැත්තෙමි. එල්.ටී.ටී.ඊ. ය විසින් දශක තුනක් තිස්සේ සිදු කළ මිලේච්ඡ යුද්ධය අවසානයෙන් පසුව වසර 5 ක් තුළ දී ශ්‍රී ලංකාව ජාතිය ගොඩනැගීම සහ ප්‍රතිසන්ධානය වෙනුවෙන් ධෛර්යවන්ත පෙරත්සම් සහගත ගමනක් ඇරඹුවේය.

අද තීන්දුව කුමක් වුවද ප්‍රජාතන්ත්‍රිකව බලයට පත්ව සිටින ශ්‍රී ලංකා ආණ්ඩුව, එමෙන්ම සාමය කැමැති මාගේ රටේ සියලු ජනතාව යළි කිසි දිනෙක ආයුධ සන්නද්ධ අරගලයකට හෝ ත්‍රස්තවාදයකට හෝ දිවි දීමක් සිදු නොකරනු ඇති බව මම නිශ්චිතවම ප්‍රකාශ කරනු කැමැත්තෙමි.

මේ යෝජනා කෙටුම්පත එක්සත් ජාතීන්ගේ සාමාජික රටක ස්වාධීනත්වයටත් ස්වෛරීභාවයටත් අභියෝග කරන බැවින් ද අන්තර්ජාතික නීති මූලධර්ම උල්ලංඝනය කරන බැවින්ද අසීමිත ලෙස ද්වේෂ සහගත පූර්ව අනුමාන මත පදනම් වී ඇති හෙයින්ද සහ ශ්‍රී ලාංකික ජනතාවගේ මිනෑ එපාකම් කෙරෙහි අවැඩදායක ලෙස බලපාන බැවින් ද ලංකාව නිරපේක්ෂකව සහ සැපුවම මේ යෝජනා කෙටුම්පත ප්‍රතික්ෂේප කරන්නේය. දේශීය ක්‍රමවේද මත පදනම් වන ශ්‍රී ලාංකික ජනතාවගේ අභිලාෂයන්ට මෙහෙවීන්ම අනුරූප වන ප්‍රතිසන්ධාන සහ ජාතිය ගොඩ නැගීමේ දැනට ක්‍රියාත්මක වැඩ පිළිවෙළ සඳහා ශ්‍රී ලංකා රජයේ කැපවීම සහ අධිෂ්ඨානය මම යළි යළිත් අවධාරණය කරනු කැමැත්තෙමි. අන්තර්ජාතික ප්‍රජාව සමග ද එක්සත් ජාතීන් සමග ද පවත්වාගෙන යනු ලබන නිරන්තර සහයෝගිතාව කෙරෙහි ශ්‍රී ලංකාව නිත්‍ය ලෙසම රැඳී සිටින බවට ද මම සහතික වෙමි.

මේ නිසා අද කවුන්සිලයට ඉදිරිපත් කෙරෙන මෙම යෝජනා කෙටුම්පත මගින් එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ සඳහන් ප්‍රධාන ගුණාංග ද ශ්‍රී ලාංකික ජනතාවගේ ස්වෛරීභාවය ද මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රඥප්තිය ද මිනිස් වර්ගයා අතර සමානාත්මතාව පිළිබඳ නීතියේ මූලධර්ම ද ක්ෂය කර දමන බව ශ්‍රී ලංකා රජය ප්‍රකාශ කර සිටී.

මේ නිසා කවුන්සිලයේ සාමාජිකයන්ගෙන් මා ඉල්ලා සිටින්නේ මේ යෝජනාව ඡන්දයකින් ප්‍රතික්ෂේප කරන ලෙසටය.